දෙපාර්තමේන්තු චක්‍රලේඛ ...13.../2018

මගේ අංක :SWD 06/02/2018
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2018.10.19

සියළුම බන්ධනාගාර අධිකාරී/සහකාර අධිකාරීවරුන් වෙත,

බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස මනා ලෙස පවත්වාගෙන යෑම.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු නිල නිවාස විධිමත්ව පාලනය කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම පිණිස මෙහි සඳහන් උපදෙස් හා නියමයන්, නිල නිවාස පාලනය කරන අධිකාරීවරුන්/සහකාර අධිකාරීවරුන් වෙත නිකුත් කරමි.

2) ඔබ බන්ධනාගාරය සීමාවේ පවතින හා ඔබගේ පරිපාලනයේ ඇති නිල නිවාසවල නඩත්තුව හා පාලනය විධිමත්ව පවත්වා ගෙන යෑම සඳහා දැනට අනුගමනය කරන ක්‍රියා මාර්ගවලට අමතරව පහත දක්වා ඇති ක්‍රමවේදයන් අනුගමනය කරන ලෙස දන්වා සිටිමි.

1. ඔබ බන්ධනාගාර සීමාවේ ස්ථාපිත බන්ධනාගාර නිලධාරීන්ට ලබා දී ඇති නිල නිවාසවල පාලනය බන්ධනාගාර රෙගුලාසි 308 හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග (ඒ) vi පරිච්ඡේද ප්‍රකාරව නිසි පරිදි පවත්වාගෙන යායුතුය.
2. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 218, 234 පරිදි දිනපතාම නිල නිවාස පරිශ්‍රයේ ඇති අංගණ හා ජලවහන පද්ධති මනා ලෙස ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කල යුතුය.
3. බන්ධනාගාර රෙගුලාසි 308(2) හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 229 පරිදි, මාගේ පූර්ණ අනුමැතියකින් තොරව මෙම නිවාසවල බන්ධනාගාර නිලධාරියා හා කාලත්‍රයා, දරුවන් සහ පවුලේ සේවකයන් දෙදෙනෙකුට නොවැඩි ගණනක් හැරුණු විට අන් කිසිවකු පදිංචිවීමට ඉඩනොදිය යුතුය, ඒ අනුව පිටස්තර අය නොසිටින බවට අදාළ අධිකාරී වග බලා ගත යුතුය.
4. බන්ධනාගාර රෙගුලාසි 308(4) හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 224, 225, 235 ප්‍රකාරවන නිල නිවාස හා එම පරිශ්‍රයේ අපේක්ෂිත විනය හා සංවර බව පවත්වාගෙන යෑමට අදාළ අධිකාරී වග බලා ගතයුතුය, එම වගන්ති උල්ලංඝණය කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියා කල යුතුය.
5. මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 228 පරිදි අවම වශයෙන් මාසයකට වරක් හෝ ජේලර්වරයෙකු යොදවා පරීක්ෂා කරවීමට පියවර ගතයුතුය.
6. ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 6:3 වගන්තිය ප්‍රකාරව මෙම නිවාසවල වෙන්කල නිලධාරියා/නිලධාරිනිය හා පවුලේඅය පදිංචිව සිටීදැයි සොයා බලා කටයුතු කල යුතුය.
7. මෙම නිවාසවල පවතින නඩත්තු හා අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් වාර්ෂික සැලස්ම අනුව ඇස්තමේන්තු ගත කර බන්ධනාගාර මූලස්ථානය වෙත එවිය යුතුය.

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

වයි එන්/=